# සමාජ ආර්ථික විකල්පයක අවශ්‍යතාවය

කොමියුනිස්ට් පක්ෂයේ සිවගුරු ගනේෂන් දැන් පක්ෂයේ සීමාවෙන් පිටතට පැමිණ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයක් බිහිකරන්නට වෑයම් කරමින් සිටිනු පෙනේ. එය කාලයේ අවශ්‍යතාවයක් බව ඔහු අවධාරණය කර තිබේ. මේ පිළිබඳ සාකච්ඡාවන් තුලට මහාචාර්ය කුමාර් ඩේවිඩ් මහාචාර්ය සුමනසිරි ලියනගේ, ආචාර්ය ගාමිණී කුලතුංග, මාධ්‍යවේදී ලක්ෂ්මන් ගුණසේකර, ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්, ආචාර්ය නිමල්කා ප්‍රනාන්දු, සීලන් කදිරගාමර් මෙන්ම ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ඇතුළු විද්වතුන් රාශියක් ඇතුල් වී සිටී.

මේ සාකච්ඡාවන් හි ප්‍රතිඵලයක් ලෙස මූලික වශයෙන් යුද්ධය සම්බන්ධයෙන් ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරන මේ පිරිස එහිදී,

> ".....තිරසාර සාමයක් දිසාවට තැබෙන පළමු පියවර ලෙස රටේ උතුරු නැගෙනහිර අන්තර්වාර පරිපාලන ව්‍යුහයක් ස්ථාපිත කරලීම ඉලක්ක කර ගනිමින් සටන් විරාමයක් වහාම ක්‍රියාත්මක කොට, යුද වැදී සිටින පාර්ශව අතරේ නැවත සාකච්ඡා ආරම්භ කරන ලෙස....."

ඉල්ලීමක් කරයි.

එහිදී තව දුරටත් සාමය සඳහා මාවත වැටී ඇත්තේ එක්සත් ශ්‍රී ලංකාවක් තුල සුලු ජාතීන් කෙරේ උපරිම බලය විමධ්‍යගත කැරෙන බලය බෙදා ගැනීමක් තුළ පමණක් බවද අවධාරණය කර තිබේ. මේ ස්ථාවරයන් මගින් ඔවුන් යුදවාදයට යටවී සිටින වාසුදේව නානායක්කාර ඇතුළු ඊනියා වාමාංශිකයන්ගෙන් හා වික්ටර් අයිවන් වැනි නින්දාසහගත ලිබරල්වාදින්ගෙන්, බලගතු වෙන්වීමක් සනිටුහන් කර ඇත්තේය.

මෙම එකතුව පිළිබඳව අදහස් දක්වන මහාචාර්ය කුමාර් ඩේවිඩ් පවසන්නේ ලංකාව තුළ විකල්ප වමක්, ඒ මගින් තුන්වෙනි බලයක් ගොඩ නැගීම අද අත්‍යාවශ්‍යව තිබෙන බවයි. ඉංදීය කොමියුනිස්ට් පක්ෂයේ වැඩපිළිවෙල මගින් දාලිත් වරුන්ගේ පක්ෂ හා සංවිධානවලත් සහාය ලබා එවැනි තුන්වන බලයක් මතු කිරීමට සමත් සිටින බව පෙන්වා දෙන හෙතෙමේ නමුත් ලංකාවේ ආණ්ඩුවට සම්බන්ධව සිටින වමේ පක්ෂ තමන් 'ආණ්ඩුවේ වම' ලෙස ක්‍රියාකළ යුතුය යන සීමාවේ හිරවී සිටින බවද ඔහු කියයි. නමුත් මේ පක්ෂ වල වැදගත් නායකයින් රාශියක් තුන්වැනි බලවේගයක් ලෙස විකල්ප වමක් ගොඩ නැගීමේ අදහස තුළ එක්වී දිගින් දිගටම සාකච්ඡා මාලාවක් පවත්වාගෙන යමින් තිබෙන බවත් ඔහු සඳහන් කළේය.

දැන් මේ තුන්වැනි බලවේගයක් ලෙස විකල්ප වමක් මතු කරගැනීමේ අරගලයේ නියුතු පිරිස් අතර යුද්ධයට එරෙහිවත්, දෙමළ ජනතාවගේ ස්වයංතීරණය ගැනත් පොදු අදහසක් තිබෙන බව පෙනෙයි. ඒ නිසාම මේ එකතු වීමේ පෙළඹීම, ජවය මතුවන්නේ ජාතික ප්‍රශ්නයට යුධමය විසඳුමක් ඇතයි යන මිත්‍යාව මත ආණ්ඩුව ගෙන යන වර්ගවාදී ම්ලේච්ඡ යුධයට තිබෙන විරුද්ධත්වය තුළින් බව පැහැදිලිය. රාජපක්ෂ මිලිටරි ජුන්ටාවේ අත්තනෝමතික අධිකාරී බලයට අභියෝග කරමින් ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණයක් බිහිකර ගැනීමේ පරමාර්ථයෙන් බව ද පැහැදිලිය.

නමුත් විකල්ප වමක් පිළිබඳ ප්‍රශ්නයේදී සමාජ ආර්ථික විකල්පයක් රටට ඉදිරිපත් කිරීම මග හැරිය නොහැකි වගකීමක් බවට පත් වෙයි. එසේ නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව, දෙමළ ජනතාවගේ ජාතික අයිතීන් ලබා ගැනීමට සහයෝගය දීම යන සීමාවේ දිගුකාලීනව ශක්තිමක් විකල්ප වමක් ගොඩ නැගිය හැකියයි විශ්වාස කිරීමට අමාරුය. මන්ද යත් පෙර කී ඊනියා වම්මුන් හා ලිබරල් හෙවනැලි අද තර්ක කරන්නේ යුධයෙන් විමුක්ති කොටි සංවිධානය පරාජය කිරීම මගින් වේගවත් තිරසාර ධනපති සංවර්ධනයට මාවත පැදෙන බවය. රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධය ඔවුන් සමාන කරන්නේ 19 වන ශත වර්ෂය ආරම්භයේ දී ප්‍රංශයේ නැපෝලියන් බොනපාට් යුරෝපයේ අවිර්ණකල්පික රදළ බලය බිඳ ධනපති සංවර්ධනයට මග හෙළිපෙහෙලි කිරීමට ය. ධනපති සමාජයේ මූලාරම්භක යුගයේ තත්වයන් හා අද ගෝලීය ධනවාදී යුගයේ තත්ත්වයන් අතර වෙනස මේ මෝඩයන්ට නොපෙනෙන්නේ යුධවාදය ඒ තරමටම මොවුන්ගේ ඇස් අන්ධ කර ඇති නිසාය.

කෙසේවෙතත් කොටි සංවිධානයේ පරිපාලනය අහෝසි කළ නැගෙනහිර පලාතේ කරගෙන යන සංවර්ධනය දෙස බලන කල මෙම සංවර්ධනයේ ගති ස්වාභාවය පැහැදිලිය. එනම් රටේ සාමාන්‍ය ජනතාව විසින් ගෙවීමට සිදුවන මහා පරිමාණ ණය කන්දරාවන් මත අධිව්‍යුහයන් ගොඩනගා ඒවා ප්‍රයෝජනයට ගෙන ලාබ කුට්ටි ගරා ගැනීමට විදෙස් ආයෝජකයන්ට අවස්ථාව සැලසීමයි. ප්‍රදේශවාසී ජනතාවට සිදුවන්නේ තමන්ගේ ගම් බිම්, සම්ප්‍රදායික ජීවන රටාවන් මේ යටිතල පහසුකම් වෙනුවෙන් හා බහුජාතික ආයෝජනයන් ට ඉඩ සැලසීම වෙනුවෙන් ඩෝසර් කරනු ලැබීම නිසා ආර්ථික සරණාගතයන් ලෙස තුට්ටු දෙකේ වැටුපට වැඩ කරන කුලී කරුවන් බවට පත් වීමටය. ඒ මගින් බහුජාතික සමාගම් වලට අවශ්‍ය ලාබ ශ්‍රමය සැපයීමට ආණ්ඩුව අවස්ථාව සලසා ගනී.

දැන් මේ සංවර්ධනය, සංවර්ධනයක් ලෙස මේ ගොඩ නැගීමට යන වාමාංශික තුන්වන බලවේගයේ න්‍යායධරයන් සූදානම්ද? නැතිනම් විකල්ප බලයක් ලෙස මතුවීම සඳහා විකල්ප තිරසාර සංවර්ධන මාවතක් රටට ඉදිරිපත් කිරීමට සූදානම්ද? නොඑසේම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා විකල්පයක් වන අතරේ ආර්ථික සංවර්ධනයේ දී වික්ටර් අයිවන් සමඟ රාජපක්ෂ මාවතේ පිය මනින්නේ ද යන්න ද ඉක්මනින්ම පැහැදිලි කර ගත යුතුය. එයට පිළිතුරක් ජනතාවට ඉදිරිපත් කිරීම අද යුධවාදයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය මතු කිරීමේදී වැලැක්විය නොහැක්කකි. එසේ පරිපූර්ණ සමාජ ආර්ථික විකල්පයක් නොවන තාක් දුරට මේ තුන්වැනි බලවේගයට කම්කරු පංති ව්‍යාපාරයේ හා ජනතා ව්‍යාපාරයන්හි ප්‍රගතිශීලින් ඇමතීම පහසු නොවේ. විකල්ප වමක් යනු ජනතා බිමේ නායකත්වයක් ගොඩ නැගීම සමඟ බැඳී පවතින්නක්ම වන්නේය.

ඒ අතරම තමන් ගොඩනැගීමට යන මේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයේ නායකත්වය කෙවැනිද යන්න ගැනත්, ඒ නායකයන් කව්ද යන්න ගැනත් ජනතාව ඉදිරියේ නිරවුල් කිරීම වැදගත් වෙයි. ඔවුන් අතරින් ජනතා විශ්වාසය දිනාගත් නායකත්වයක් මතු කර පෙන්වීම ද මේ යුගයට අවශ්‍යය යන්න නොතකා හැරීම කට්ටිවාදී, මෙන්ම අවස්ථාවාදී ස්වාභාවයක් ගන්නක් ද වේ. එවිට සටන්කාමී ප්‍රගතිශීලී ජනකොටස් මේ ගොඩනැගීමට යන නායකත්වය පිළිබඳව වපර ඇසින් බැලීම වැලැක්වීමට නොහැකි වනු ඇත්තේය.